චක්‍රලේඛ අංක :07/2014

මගේ අංකය : බප/සසේකො/6-චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2014-12-31

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල,
ස.ණ.ස. සමිති සහ ස.ණ.ස. සංගම්වල ගරු සභාපතිවරුන් වෙත ,

<u>සමුපකාර සේවකයින් සඳහා කාර්යසාධනය මත පදනම් වූ දීමනා ගෙවීම.</u>

සිය රාජකාරී ඉටු කිරීමේ දී සුවිශේෂී කාර්යසාධන තත්ත්වයන් පෙන්නුම් කරන සමුපකාර සේවකයින් සහ විශේෂීකරණය වූ රාජකාරී පැවරී ඇති තනතුරු දරන ඇතැම් සමුපකාර සේවකයින් සඳහා විවිධ දීමනා ගෙවීම සම්බන්ධයෙන් සමුපකාර සමිති විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා, එවැනි සේවකයින්ගේ කාර්යසාධනය පදනම් කර ගනිමින් දීමනා ක්‍රම අනුමත කිරිම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වාදීමට බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

02. දැනට කොමිෂන් සභාව විසින් සියළුම සමුපකාර සමිති සේවකයින් සඳහා පොදුවේ අනුමත කරනු ලබන දීමනාවන් හැර, (උදාහරණ - ජීවන වියදම් දීමනා, අන්තර් දීමනා, විශේෂ දීමනා) සිය සමිතියේ සේවකයින් හට විශේෂිත රාජකාරී ඉටුකිරීමේ පදනම මත විශේෂිත වූ දීමනාවක් ගෙවීමට කිසියම් සමුපකාර සමිතියක් අදහස් කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ඇමුණුම 01 පරිදි ලේඛන ඉදිරිපත් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

03. එවැනි යම් විශේෂිත වූ දීමනාවක් ගෙවීමට යෝජනා කිරීමේ දී සැමවිටම, සමිතියේ සමස්ත සේවකයින් ආවරණය වන පරිදි එකී දීමනා ක්‍රම සකස් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. එසේම, එක් සේවක පිරිසක් සඳහා යෝජිත විශේෂිත වූ දීමනා ක්‍රමයක් මගින් එම දීමනා හිමි නොවන අනෙකුත් සේවකයින්ගේ කාර්යසාධනය උදාසීන කිරීමෙහි බලපෑමක් සිදු නොවිය යුතුය.

04. කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් ආකාරයට අනුමත කරනු ලබන දීමනා, සේවකයන්ගේ සේවා පාරිතෝෂිකයට අදාල නොවන අතර, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීම සම්බන්ධයෙන් වන කල් හි කම්කරු නීතිරීති අනුව කටයුතු කළ යුතු වේ.

05. සියළුම සමිති විසින් තම සමිතියේ මූල්‍යමය ශක්‍යතාවයට සමපාත වන ලෙසත්, සමිතියේ අභිවෘද්ධිය හා සේවක අභිප්‍රේරණය සැලකිල්ලට ගෙන දීමනා ක්‍රම යෝජනා කරනු ලැබිය යුතු වේ.

06. මෙම චක්‍රලේඛය යටතේ දිරි දීමනා ක්‍රමයක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් පාදක කර ගැනීම සුදුසු බව ද අවධාරණය කරනු ලැබේ.

I. කාල ක්‍රමය (අතිකාල දීමනා, පැමිණීමේ දීමනා )
II. කැලි ක්‍රමය (නිෂ්පාදිත ඒකක ප්‍රමාණය, සේවා ඒකක ප්‍රමාණය )
III. කාල සහ කැලි ක්‍රමය (ඒකාබද්ධ ක්‍රමය )
IV. ප්‍රසාද දිරි දීමනා
V. වෙළඳාම / පිරිවැටුප පදනම ලෙස යොදා ගැනීම.
VI. වියදම් අවම වීම, නිෂ්පාදන,සේවා පිරිවැය අවම වීම වැනි පදනම් ද යොදාගත හැකි වනු ඇත. තම නිෂ්පාදන, සේවා හෝ වෙළඳාමේ ස්වභාවය අනුව ඉහත ක්‍රම හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් සේවක කාර්ය සාධනය හා බද්ධ වන පරිදි යොදා ගැනීම සිදු කල යුතුය. (ආදර්ශ ආකෘතිය පසු පිට අමුණා ඇත.)

07. කොමිෂන් සභා නියමය පරිදිය.

ඩබ්. පී. එම්. පී. ආර්. ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් : 01. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත.
02. ලේකම්, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු , සමුපකාර සංවර්ධන අමාත්‍යංශය - බස්නාහිර පළාත.
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.
04. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - බස්නාහිර පළාත.
05. ලේකම්, සමුපකාර සමුපකාර සේවක කොමිෂන් සභාව.
06. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව,
මධ්‍යම/දකුණ/උතුරු/නැගෙනහිර/වයඹ/උතුරුමැද/ඌව/සබරගමුව
07. සියළුම වෘත්තීය සමිති සංගම්

**<u>සමුපකාර සේවකයින් සඳහා දීමනා අනුමත කිරීමට අවශ්‍ය ලිපිලේඛණ</u>**

01. සමිතියේ සභාපතිවරයාගේ අත්සනින් යුක්තව දීමනා අනුමත කිරීම සඳහා වූ ඉල්ලීම් ලිපිය.

02. දීමනා අනුමත කිරීම සුදුසු බවට තීරණය කරනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ පිටපතක්.

03. යෝජිත දීමනා ක්‍රමය ඇතුළත් ව්‍යාපෘති වාර්තාව.

මෙම ව්‍යාපෘති වාර්තාවේ අවම වශයෙන් පහත සඳහන් කරුණු ඇතුලත් කිරීම යෝග්‍ය වේ.

(අ) දීමනා ක්‍රමයක් හඳුන්වා දීමට බලපාන ලද කරුණු.

(ආ) දීමනා ක්‍රමයක් මඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු.

(ඇ) දීමනා ක්‍රමය කුමන පදනමක් මත ගණනය කරන්නේ ද එය කාර්ය සාධනය හා බද්ධ වන්නේ කෙසේද

(ඈ) යෝජිත දීමනා ගෙවීමට සමිතියට ආර්ථික හැකියාවක් තිබේද

(ඉ) දීමනා ගෙවීමෙන් සමිතියට, සේවකයන්ට ඇතිවන ආර්ථික හා වෙනත් ප්‍රතිලාභ පිළිබඳ විස්තර

04. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන ලද අවසන් වර්ෂ දෙකකට අදාල මූල්‍ය ප්‍රකාශන.

---

**සේවක අභිප්‍රේරණය සඳහා දිරි දීමනා ක්‍රමයක් සකස් කිරීමේදී යොදාගත හැකි ක්‍රමවේද පිළිබඳ ආදර්ශය.**

සටහන 01

1. කාල ක්‍රමය

සේවය කරන කාලය පදනම් කර ගනු ලැබූ දීමනා ක්‍රමයයි.

උදාහරණ :

| තනතුර | අනිවාර්ය සේවා කාලය (දින/පැය) | අමතරව සේවය කරන කාලය සඳහා යෝජිත ගෙවීම (දිනකට/පැයකට) | උපරිම දින/පැය ගණන |
|---|---|---|---|
| | | | |
| | | | |

පැමිණීමේ දීමනා, අතිකාල දීමනා, නිදසුන් ලෙස දැක්විය හැකිවේ.

2. කෑලි ක්‍රමය

නිෂ්පාදිත ඒකක ගණන පදනම් කර ගනු ලැබූ දිරි දීමනා ක්‍රමයයි.

උදාහරණ :

| තනතුර | අනිවාර්යයෙන් ඉටු කළ යුතු ඒකක ගණන | අමතරව ඉටු කරන ඒකකයක් සඳහා යෝජිත ගෙවීම (දිනකට/පැයකට) | උපරිම ඒකක ගණන |
|---|---|---|---|
| | | | |
| | | | |

නිෂ්පාදන ඒකක ප්‍රමාණය, අලෙවි ඒකක ප්‍රමාණය, ගෙවුම් ඒකක ප්‍රමාණය නිදසුන් වේ.

3. ඒකාබද්ධ ක්‍රමය

කාලය සහ ඒකක ගණන යන නිර්ණායක දෙකම පදනම් කර ගනු ලැබූ දිරි දීමනා ක්‍රමයයි.

4. ආදායම් ඉහළ යාම, වියදම් අවම වීම වැනි ක්ෂේත්‍රයන් ද පදනමක් ලෙස යොදා ගනු ලැබිය හැකිය.

5. ප්‍රසාද දිරි දීමනා ක්‍රමය - මෙය ලාභය පදනම් කරගත් දීමනා ක්‍රමයයි. කිසියම් සේවකයෙක් හෝ සේවක පිරිසක් විසින් ඉටුකරන ලද සුවිශේෂී කාර්යසාධනය හේතුවෙන් සමිතියේ ආංශික හෝ සමස්ත ලාභය ඉහළ යාම පදනමක් ලෙස ගෙන දීමනා ගෙවීම යෝජනා කිරීම වේ.

6. ඉහත සඳහන් නිර්ණායක හෝ විශේෂිත වූ රාජකාරිමය ක්ෂේත්‍රයට අදාල සේවකයන් කාර්ය සාධනය හා බැඳුනු පිළිගත හැකි ක්‍රමවේදයක් මත පමණක් ඉදිරිපත් කෙරෙන දීමනා යෝජනා පමණක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබේ.